# ගිණුම්කරණය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ සංචිතය

## 13

## අනුපාත මඟින් මූල්‍ය ප්‍රකාශ විශ්ලේෂය සහ අර්ථකථනය කර කළමනාකරණ තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරයි - බහුවරණ සහ කෙටි ප්‍රශ්න

1. පහත සඳහන් අනුපාත අතරින් ආයතනයක දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වට මැනීමට යොදා ගන්නා අනුපාතය වන්නේ,

   (1) මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය
   (2) කොටසක ලාභාංශ අනුපාතය
   (3) දළ ලාභ අනුපාතය
   (4) ශුද්ධ ලාභ අනුපාතය
   (5) පොලී ආවරණ අනුපාතය

**අංක 2 හා 3 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

| | |
|---|---|
| විකුණුම් | 15,000 |
| විකුණුම් පිරිවැය | 8,500 |
| මෙහෙයුම් වියදම් | 1,500 |
| පොලී වියදම | 400 |
| ආදායම් බදු වියදම | 500 |
| 2020.04.01 දිනට තොගය වටිනාකම | 900 |
| 2021.03.31 දිනට තොගය වටිනාකම | 700 |
| 2020.04.01 දිනට වෙළඳ ලැබිය යුතු දෑ | 350 |
| 2021.03.31 දිනට වෙළඳ ලැබිය යුතු දෑ | 450 |

- වර්ෂයේ මුළු විකුණුම් වලින් 20% අත්පිට විකුණුම් වේ.
- 2021.03.31 දිනට හිමිකම් වටිනාකමරු. 6,000,000 ක් වන අතර වගකීම් ප්‍රමාණය රු. 4,000,000 ක් වේ. වර්ෂයකට දින ගණන 365ක් වේ.

2. මෙම සමාගමේ මුළු වත්කම් ප්‍රතිලාභ අනුපාතය හා ණය එකතු කිරීම් කාලයේ අනුපාතය වන්නේ,

| | මුළු වත්කම් ප්‍රතිලාභ අනුපාතය | ණය එකතු කිරීම් කාලයේ අනුපාතය |
|---|---|---|
| (1) | 45% | 9.73 |
| (2) | 50% | 12.16 |
| (3) | 37% | 18.33 |



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

| | | |
|---|---|---|
| (4) | 67% | 20.33 |
| (5) | 83.33 | 23.45 |

3. සමාගමේ තොග රඳවුම් කාලය හා ශුද්ධ ලාභ අනුපාතය වන්නේ,

| | තොග රඳවුම් කාලය | ශුද්ධ ලාභ අනුපාතය |
|---|---|---|
| (1) | 9.0 | 20% |
| (2) | 12.16 | 27% |
| (3) | 9.41 | 16% |
| (4) | 10.5 | 25% |
| (5) | 14.0 | 23% |

4. සී/ස කඳුරට සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වසර 2 කට අදාල උද්ධෘතයන් පහත පරිදි වේ.

| | | (රු. 000) |
|---|---|---|
| | **2020.03.31** | **2021.03.31** |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 45,000 | 54,000 |
| ප්‍රත්‍යාගණන සංචිත | 9,000 | 12,000 |
| පොදු සංචිත | 15,000 | 18,000 |
| රඳවාගත් ඉපයුම් | 16000 | 24,000 |
| 15% උකස් ණය | 6000 | 4,000 |
| 18% බැංකු ණය | 17000 | 14,000 |
| ජංගම වත්කම් | 43000 | 40,000 |
| ජංගම වගකීම් | 18000 | 15,000 |
| වාර්ෂික ආදායම් බදු වටිනාකම | 1600 | 900 |

බදු පෙර ලාභය මුළු හිමිකමෙන් 10% වේ.

2021.03.31 දිනට පහත දෑ ගණනය කරන්න.

(1) ණය හිමිකම් අනුපාතය
(2) පොලී ආවරණ අනුපාතය

5. ව්‍යාපාරයක ජංගම අනුපාතය ක්ෂණික අනුපාතය මෙන් දෙගුණයක් නම්, නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ජංගම වත්කම් ජංගම වගකීම් වලින් භාගයකි.
(2) ජංගම වත්කම් ජංගම වගකීම් මෙන් දෙගුණයකි.
(3) තොගය හා ඉදිරියට කළ වියදම් හැර ජංගම වත්කම්, තොගය හා ඉදිරියට කළ වියදම් මෙන් දෙගුණයකි.
(4) තොගය ජංගම වත්කම් වලින් හරි අඩකට සමාන වේ.
(5) ජංගම වගකීම් ජංගම වත්කම් මෙන් දෙගුණයකි.

6. ණය ගැතියකු විසින් ශේෂය පියවූ විට සමාගමක ජංගම අනුපාතය

(1) අඩුවේ (2) වැඩිවේ (3) වෙනස් නොවේ

(4) වැඩිවේ (5) අඩුවේ

7. පහත සඳහන් කුමන සූත්‍රය පොලී ආවරණ අනුපාතය ගණනය කිරීමට යොදා ගනීද?

(1) වර්ෂයේ ලාභය + පොලිය / පොලිය

(2) බදු පෙර ලාභය / ශුද්ධ ලාභය

(3) පොලි වියදම / වර්ෂයේ ලාභය

(4) බදු පෙර ලාභය + පොලිය / පොලිය

(5) වර්ෂයේ ලාභය - පොලිය / පොලිය

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව